# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/15 - 2016 මැයි මස 18 වැනි බදාදා - 2016.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛන අංක I හා II විස්තර කර ඇති ඉඩම් කොටස් මාලබේ බස් නැවතුම්පළ ඉදිකිරීම ඇතුළු නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 මැයි මස 16 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය I

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහානගර සභා බල ප්‍රදේශය තුළ, පල්ලේපත්තුව හේවාගම් කෝරළයේ, කොට්ඨාස අංක 7 තලංගම උතුර පිහිටි ඉඩමට අදාළව ඇඳ ඇති අංක 3762 දරන සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 1 රූඩ් 0 පර්චස් 38.60 (හෙක්. 0.5023) ක් පමණ වූ දොඹගහවත්ත හෙවත් තැඹුගහවත්ත හෙවත් මාලබේ බස් නැවතුම්පළ නැමති ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ ;

| | | |
|---|---|---|
| *උතුරට* | : | උඩවත්ත පාර සහ නව නුවර පාර ; |
| *නැගෙනහිරට* | : | නව නුවර පාර, දොඹගහවත්ත සහ අතුරුගිරිය දක්වා පාර ; |
| *දකුණට* | : | මෙට්රෝ වාණිජ සංකීර්ණය හා මාලබේ වෙළඳපළ ; |
| *බටහිරට* | : | මාලබේ වෙළඳපළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලබේ තැපැල් කාර්යාලය සහ උඩවත්ත පාර. |

### උපලේඛනය II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහානගර සභා බල ප්‍රදේශය තුළ, පල්ලේපත්තුව හේවාගම් කෝරළයේ, කොට්ඨාස අංක 7 තලංගම උතුර ගමෙහි පිහිටි ඉඩමට අදාළව ඇඳ ඇති දළ සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 3 පර්චස් 30 (හෙක්. 0.3795) ක් පමණ වූ දොඹගහවත්ත හෙවත් තැඹුගහවත්ත නැමති ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ ;


1A - G 23492 — 17 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| *උතුරට* | : | නව නුවර පාර ; |
| *නැගෙනහිරට* | : | අතුරුගිරිය පාර සහ මාලබේ බස් නැවතුම්පළ ඉඩම ; |
| *දකුණට* | : | මාලබේ බස් නැවතුම්පළ ඉඩම ; |
| *බටහිරට* | : | මාලබේ බස් නැවතුම්පළ ඉඩම. |

06 - 89/1

---

## 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

### 2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, බත්තරමුල්ල නගර සංවර්ධන වැඩසටහන යටතේ, බහු මහල් රථ අංගනයක් ඉදිකිරීම කිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 මැයි මස 16 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහානගර සභා බල ප්‍රදේශය තුළ, පල්ලේපත්තුව හේවාගම් කෝරළයේ, බත්තරමුල්ල ගමේ පිහිටි ඉඩමට අදාළව ඇඳ ඇති අංක 7940 දරන සැලැස්මේ කැබලි අංක A වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 3 පර්චස් 11.50 (හෙක්. 0.3326) ක් පමණ වූ ගොඩැල්ලවත්ත නොහොත් මිල්ලගහවත්ත සහ කොට්ටනුවේ කුඹුර නැමති ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ ;

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල සහ වරිපනම් අංක 21/1 දරන කඩුවෙල පාර පිහිටි නිවස ; |
| *නැගෙනහිරට* | : | වරිපනම් අංක 21/1, 19/2 සහ 15 දරන කඩුවෙල පාර පිහිටි නිවස සහ තුප්පහිගේ කරෝලිස්ට හා තවත් අයට අයත් ඉඩම ; |
| *දකුණට* | : | රජයේ ඉඩම, කඩුවෙල පාර, වරිපනම් අංක 19/2, 15 හා 11 දරන කඩුවෙල පාර පිහිටි නිවාස සහ ඇල ; |
| *බටහිරට* | : | රජයේ ඉඩම සහ ඇල. |

06 - 89/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.